06 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
# Information & Communication Technology

අංක 06

## Part I

- **පහත දැක්වෙන ප්‍රශ්න අතුරින් වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අන්තර්ජාලය යනු කුමක් ද?
   1) පරිගණක දෙකක් එකිනෙකට සම්බන්ධ කිරීම.
   2) ලොව පුරා ඇති පරිගණක රැසක් එකිනෙකට සම්බන්ධ වීමෙන් සෑදුණු ජාලයකි.
   3) විදෙස් රටක පවතින පරිගණක ලබාදෙන සේවාවකි.
   4) මෘදුකාංග රැසක එකතුවකි.
2. පරිගණකය තුළ දත්ත සහ තොරතුරු ස්ථිරවම ගබඩා කරන්නේ කුමන උපාංගය තුළද?
   1) පද්ධති ඒකකය (System Unit)
   2) මධ්‍ය සැකසුම් ඒකකය (CPU)
   3) දෘඪ තැටිය (Hard Disk)
   4) මව් පුවරුව (Motherboard)
3. අන්තර්ජාලයෙන් තොරතුරු සෙවීමට යොදාගන්නා මෘදුකාංග හඳුන්වන්නේ කුමන නමින් ද?
   1) සෙවුම් යන්ත්‍ර (Search Engine)
   2) වෙබ් අතරික්සු (Web Browser)
   3) චිත්‍රක මෘදුකාංග
   4) මෙහෙයුම් පද්ධති
4. වෙබ් පිටුවක් බැලීමට යොදාගන්නා මෘදුකාංග හඳුන්වන්නේ කුමන නමින් ද?
   1) චිත්‍රක මෘදුකාංග
   2) වදන් සැකසුම් මෘදුකාංග
   3) වෙබ් අතරික්සු (Web Browser)
   4) මෙහෙයුම් පද්ධති
5. පහත සඳහන් මෘදුකාංග අතුරින් වෙබ් අතරික්සුවක් නොවන්නේ කුමක් ද?
   1) Microsoft Edge
   2) Google Chrome
   3) Mozilla Firefox
   4) Microsoft Word

- **පහත සඳහන් එක් එක් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය ඉදිරියේ (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

6. ඇල්ගොරිතමයක් ලිවීමේදී පියවර අනුපිළිවෙළින් ලිවිය යුතු ය. ( )
7. විද්‍යුත් ලිපි යැවීමට අන්තර්ජාල සම්බන්ධතාවයක් තිබීම අවශ්‍ය නොවේ. ( )
8. යෙදුම් මෘදුකාංග මගින් පරිශීලකයා හා දෘඩාංග අතර සම්බන්ධතාවය ගොඩනගයි. ( )
9. සෙවුම් යන්ත්‍රයකින් සෙවීමට බලාපොරොත්තු වන වචන මූල පද (Keywords) ලෙස හඳුන්වයි. ( )
10. අන්තර්ජාලයෙන් තොරතුරු සෙවීමට සෙවුම් යන්ත්‍ර භාවිතා කරයි. ( )
11. ඇල්ගොරිතමයක් ලිවීමේදී ආරම්භයක් හා අවසානයක් තිබීම අවශ්‍ය නොවේ. ( )
12. මුරපදයක් ලබාදීමේදී එය වෙනත් අයෙකුට අනුමාන කළ හැකි එකක් විය යුතුය. ( )
13. ගොනුවක් සුරැකීම සඳහා Save විධානය භාවිතා කරයි. ( )
14. ගොනු නාමය මගින් එය විවෘත විය යුතු මෘදුකාංගය තීරණය කරයි. ( )
15. Mac OS යනු මෙහෙයුම් පද්ධතියකි. ( )

- **පහත දැක්වෙන එක් එක් ගැටලු සඳහා සුදුසු පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. ඉලෙක්ට්‍රොනික උපාංග ආරක්ෂාකාරීව බැහැර කිරීමට භාවිතා කරයි | ආදාන උපාංගයකි. |
| 17. ශක්තිමත් මුරපදයක අඩංගු විය යුතුයි. | 3R ක්‍රමය |
| 18. තීරු කේත කියවනය (Bar code Reader) යනු | පරිගණක වෛරස් |
| 19. අහිතකර මෘදුකාංගයකි. | ප්‍රතිදාන උපාංගයකි. |
| 20. සංදර්ශකය (Monitor) යනු | සංකේත |

**(20 Marks)**

ICT Tutorials Hub

## Part II

1. පරිගණක විද්‍යාගාරයක් තුළ පවතින උපාංග වල ආරක්ෂාවට ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් නම් කරන්න. (4 Marks)


2. සන්නිවේදන උපාංග යනු මොනවා ද? ඊට උදාහරණ 2 ක් ලබාදෙන්න. (3 Marks)

3. ආදාන උපාංග යනු මොනවාද? ඒ සදහා උදාහරණ 2 ක් ලියන්න. (3 Marks)

4. ප්‍රතිදාන උපාංග යනු මොනවාද? ඒ සදහා උදාහරණ 2 ක් ලියන්න. (3 Marks)

5. ආචයන උපාංග යනු මොනවාද? ඒ සදහා උදාහරණ 2 ක් ලියන්න. (3 Marks)

6. පහත දැක්වෙන්නේ සමචතුරස්‍රයක පරිමිතිය සෙවීමට ගොඩනගන ලද ගැලීම් සටහනකි. එහි හිස්තැන් පුරවන්න. (3 Marks)



7. සෙවුම් යන්ත්‍ර (Search Engine) වල කාර්යයභාරය කුමක්ද? (1 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

8. සෙවුම් යන්ත්‍ර (Search Engine) සදහා උදාහරණ 2 ක් ලියන්න. (2 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

9. වෙබ් අතරික්සු (Web Browser) වල කාර්යයභාරය කුමක්ද? (1 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

10. වෙබ් අතරික්සු (Web Browser) සදහා උදාහරණ 2 ක් ලියන්න. (2 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

11. අන්තර්ජාලය (Internet) යනු කුමක්දැයි හදුන්වන්න. (2 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

12. අන්තර්ජාලය ඔස්සේ ඉටු කර ගත හැකි සේවා 3 ක් ලියන්න. (3 Marks)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**(Total Marks = 50 × 2 = 100)**

ICT Tutorials HUB